# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## ඒකක පරීක්ෂණය

| 11 ශ්‍රේණිය | චිත්‍ර කලාව | 3 ඒකකය |
|---|---|---|

❖ **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

01. පොළොන්නරුව ගල් විහාරයෙහි දක්නට ලැබෙන සමාධි බුදු පිළිමයෙහි ............................................. මුද්‍රාව නිරූපිතය.
02. පොළොන්නරුව ගල් විහාරයේ හිටි පිළිමය තුළින් ...................................... මුද්‍රාව නිරූපනය කෙරේ.
03. මතබේදයට ලක්වී ඇති පෙළොන්නරු ගල් විහාරයේ හිටි බුදු පිළිමය ................................................. ඉරියව්වෙන් යුක්ත වේ.
04. පොළොන්නරුවේ දක්නට ලැබෙන පැරකුම් ප්‍රතිමාවෙන් .................................................. ඍෂිවරයා නිරූපනය වන බවද කියවේ.
05. පරාක්‍රමබාහු අතෙහි ඇති පුස්කොලපොතක් වැනි උපකරණයෙන් ...................................................... සංකේතවත් කර ඇත.
06. පොළොන්නරු ශිව දේවාල අසලින් සොයාගන්නා ලද නටරාජා සහ පාර්වතී යන ප්‍රතිමා නිමවා ඇත්තේ ................................................................... මාධ්‍යයෙනි.
07. නටරාජා ප්‍රතිමාවෙන් ලෝකයේ පැවැත්ම හා .................................................. සංකේතවත් කර ඇත.
08. නටරාජා මූර්තියේ එක් පාදයකින් වාමනයකු පාගාගෙන සිටී. එයින් සංකේතවත් කර ඇත්තේ .......................................................... නැති කිරීමය.
09. නටරාජා මූර්තියේ කෙස්කළඹ තුළින් ....................................................... ගඟ නිරූපනය කර ඇත.
10. නටරාජා මූර්තියේ දක්නට ලැබෙන්නේ ...................................................... නර්තන විලාශයයි.
11. ශිව දෙවියන්ගේ පතිනිය වූ පාර්වතී දෙවඟන ................................ යන නාමයෙන්ද හඳුන්වනු ලැබේ.
12. පොළොන්නරුවේ අංක 5 දරණ හින්දු කෝවිලෙන් හමුවූ ගණදෙවි රූපය ක්‍රි.ව. ........ සියවසට අයත්වේ.
13. කාරයික්කාල් අම්මයියාර් නමැති හින්දු ආගමික ප්‍රතිමාව ලෝකඩ මාධ්‍ය හා ලෝහ .............................. ශිල්ප ක්‍රමය අනුව නිමවා ඇත.
14. පොළොන්නරුවේ නිශ්ශංක ලතා මණ්ඩපය කරවා ඇත්තේ ................................................ රජු විසිනි.
15. නිශ්ශංක ලතා මණ්ඩපයේ කණුවලට පාදක වූ පුෂ්පය හඳුන්වන්න. .....................................................
16. නිශ්ශංක ලතා මණ්ඩපය ඉදිකරවා ඇත්තේ ........................................................... කටයුතු සඳහාය.
17. පොළොන්නරු හොඳම සඳකඩපහන සොයාගෙන ඇත්තේ ................................................... වෙනි.
18. පොළොන්නරු වටදාගෙයි පිළිමවල ඇති විශේෂත්වය කුමක්ද? ......................................................
19. පොළොන්නරු වටදාගෙය ඉදිකර ඇත්තේ කිනම් රජු දවසකද? ...........................................................
20. පොළොන්නරු සකඩපහනින් ගවයා ඉවත් වූයේ ........................................... ආගමේ බලපෑම මතය.
21. පොළොන්නරුව පුද බිමේ හමුවන අංක 2 ශිව දේවාලය 10 වන සියවසේ ........................................... පාලන සමයේ ඉදිකරවන ලද්දකි.
22. අංක 2 ශිව දේවාලය ඉදිකර ඇත්තේ ....................................................... දේවිය සිහිවීම සඳහාය.

23. පහතරට කරගම්පිටිය හා කතළුව යන විහාරස්ථානවල ඇති සිතුවම් ................................................... යුගයට අයත් වේ.

24. පෙළඹවීම (මාරදූවරු) චිත්‍රය දක්නට ලබෙන්නේ පහතරට කිනම් විහාරස්ථානයකද? .............................

25. සාංචි ස්තූපය ............................................................ රජතුමා විසින් ඉදිකරවා ඇත.

26. ලංකාවේ ස්තූපයේ ඇති පේසා වළලු වෙනුවට සාංචි ස්තූපයේ ඇත්තේ .............................................. ගැනෙන පේසාවකි.

27. සාංචි ස්තූපයේ ගර්භයට ඉහළින් ඇති කොටස හඳුන්වන්නේ ............................................. යන නමිනි.

28. සාංචි තොරණ නිර්මාණය කර ඇත්තේ සුංග යුගයේදී ........................................................... විසිනි.

29. සාංචි තොරණ කැටයම් අතර එන සංකස්සපුරයට වැඩම කිරීම කැටයමෙහි බුදුන් වහන්සේ දක්වා ඇත්තේ ........................................................ සංකේතයකිනි.

30. සාංචි කැටයම් අතර වෙස්සන්තර ජාතක කථාව .................................................... කථා ශෛලියකින් දකුණේ සිට වමට කියවෙන කථා පුවතකි.

31. සාංචි තොරණෙහි මහ කුළුණත් පහළ ගල් පුවරුවත් අල්ලාගෙන සිටින ලෙස නිර්මාණය කර ඇති යක්ෂ රූපය හඳුන්වන්නේ ..................................................... යන නමිනි.

32. සාංචි කැටයම් ...................................................... ශිල්ප ක්‍රමය අනුව නිමවා ඇත්තේ ඇත්දත් කාර්මිකයන් විසිනි.

33. සාරානාත් බුදු පිළිමය .............................................. නමැති පාෂාණයෙන් නිමවා ඇත.

34. ගුප්ත යුගයට අයත් සාරානාත් බුදු පිළිමය .................................................... මුද්‍රාවෙන් හා පද්මාසන ක්‍රමයෙන් යුක්ත වේ.

35. සාරානාත් බුදු පිළිමය තුළින් පෙන්වා ඇත්තේ බුදුන් වහන්සේ .................................... ධර්මය දේශනා කරන විලාශයයි.

36. සාරානාත් පිළිමයෙහි සිවුර දක්වා ඇත්තේ ................................................. ස්වරූපයෙනි.

37. අජන්තා ලෙන් සිතුවම් චෛත්‍ය ශාලා සහ ................................................ යනුවෙන් කොටස් දෙකකි.

38. පද්මපානී බෝසත් රුව දක්නට ලැබෙන්නේ අජන්තාවෙහි ............................ දරණ ගුහාව තුළය.

39. කිඹුල්වත්පුර පිඬුසිඟා වඩින චිත්‍රය දක්නට ලැබෙන්නේ අජන්තාවෙහි .................... දරණ ගුහාව තුළය.

40. අජන්තාවෙහි අංක 17 දරණ ගුහාව තුළ දක්නට ලැබෙන ............................................ නමැති සිතුවම ලංකාවේ ඓතිහාසික පුවතක් පදනම් වූවකි.

*සැකසුම : කේ.එම්.ජී. ආනන්ද*